**"එක්සත් ජනපද - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගීතාවය: අවස්ථා සහ අභියෝග"**

ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ 183 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේදී පලකළ අදහස්

2020 ජූනි මස 30 වැනිදා, බ්‍රහස්පතින්දා ප.ව. 5.30-ප.ව.7.30

ගෝවින්දසාමි සභාපතිතුමනි, ද සිල්වා ප්‍රධාන විධායක නිලධාරීතුමනි, අධ්‍යක්ෂ මණ්ඩලයේ ගරු සාමාජිකයිනි, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ මිත්‍රවරුනි, මේ සැන්දෑවේ ඔබ ඇමතීමට මට ආරාධනා කිරීම ගැන ස්තුතියි. වසර තුනකට පසුව ඔබ මුහුණට මුහුණ හමුවී මෙම වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන පළමු අවස්ථාව මෙය බව මට දැනගන්නට ලැබුණා. තිරයක් හරහා නොව, මුහුණට මුහුණ ඔබ හැමදෙනා හමුවන්නට ලැබීම ඉතාමත් සුවිශේෂී වනවා. මණ්ඩලයේ ක්‍රියාකාරකම් ගැන සුළු මොහොතකට කලින් සභාපතිතුමා විසින් කථා කළා. එනිසා, ව්‍යවසායකත්වය, විනිවිදභාවය, යහපත් ව්‍යාපාර පාලනය, සහ ශක්තිමත් ආයතනික සමාජ වගකීම අතින් ඔබේ නායකත්වය අගය කරන්නට මා කැමතියි. මේ කාමරයට රැස්වී සිටින ඔබ හැමදෙනාම මේවා දෙස බලාසිටින ප්‍රේක්ෂකයින් පමණක් නොවේ, ඔබලා ශ්‍රී ලංකාව වඩාත් යහපත් තැනකට ගෙන ඒම සඳහා ආයෝජන හා වෙළඳ පරිසරය ද, රටේ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ද ශක්තිමත් කිරීම වෙනුවෙන් හඬ නගන අයයි.

ඊයේ, එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව නියෝජනය කරන ඉහළ පෙළේ නියෝජිත පිරිසක් වැදගත් සංචාරයක් නිමා කළා. එහිදී, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය සහකාර ලේකම්වරුන් වන රොබට් කැප්‍රොත් සහ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ කෙලී කීඩර්ලින් තානාපතිතුමිය පුළුල් පරාසයක දේශපාලන නියෝජිතයන්, ආර්ථික විද්‍යාඥයන් සහ ජාත්‍යන්තර සංවිධාන හමුවූවා. ඔවුන්ගේ ඒ හමුවීම්වල අරමුණ වූයේ දුෂ්කරතාවලට මුහුණ දී සිටින ශ්‍රී ලාංකිකයන්ට, වත්මන් ආර්ථික අර්බුදය විසඳීමට කටයුතු කරන ශ්‍රී ලාංකිකයන්ට සහ අනාගතය සඳහා තිරසාර හා සර්වග්‍රාහී ආර්ථිකයක් සඳහා සැලසුම් කරන ශ්‍රී ලාංකිකයන්ට එක්සත් ජනපදයෙන් උපකාර කළ හැකි වඩාත්ම ඵලදායී ක්‍රම ගවේෂණය කිරීමටයි. ශ්‍රී ලාංකීය ජනතාවගේ දුක් වේදනා සමනය කර ආර්ථිකය හැකි ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ආධාර පැකේජයක් සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ ගැනීම සඳහා ණය හිමියන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කඩිනමින් සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවය ද සම්බන්ධයෙන් මේ නියෝජිත පිරිස රජයට කථා කළා.

ශ්‍රී ලංකාව ඉතිහාසයේ මුහුණදුන් වඩාත් ම දුෂ්කර මොහොතක් මේ අවස්ථාවේ ගතකරන බව අප හැමදෙනාම දන්නවා. ඉන්ධන ලබාගැනීමට සැදුනු පෝලිම් වඩවඩාත් දිගු වන ආකාරය සහ මූලික අවශ්‍යතා සඳහා දරන්නට වන මිල වැඩිවන අකාරය අපි හැමදෙනාම දුටුවා. අප කවුරුත් විදුලිය කප්පාදුව නිසා අඳුරේ සිටියා, සාමකාමී විරෝධතා හරහා ශ්‍රී ලාංකිකයින් තමන්ගේ අපේක්ෂා භංගත්වය පෙන්නුම්කරන ආකාරය අප හැමදෙනාම දුටුවා. සැමදිනකම, මා සම්බන්ධවන සෑම සංවාදයකදීම, අනාගතය ගැන සහ අනාගත පරම්පරාවේ සුබසෙත ගැන ඔවුන්ට ඇති බිය ශංකා පිළිබඳව ශ්‍රී ලාංකිකයින් පවසනවා. ශ්‍රී ලංකාව ඉදිරියේ ඇති අභියෝගය බරපතළ බවට සැකයක් නැහැ. නමුත්, එය මැඩපවත්වාගන්නට බැරි අභියෝගයක් නොවේ.

සාමාන්‍ය ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්මට දායක වන ඇදහිය නොහැකි දක්ෂතා සහ පොළඹවනසුළු උත්සාහ ගැන විවිධ උදාහරණ සෑම දිනකම මට අසන්නට දකින්නට ලැබෙනවා. ශ්‍රී ලාංකීය ජනතාවගේ ඔරොත්තු දීමේ හැකියාව ගැන මට ස්ථිරවම විශ්වාසය තිබෙනවා. මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා නිර්මාණශීලීත්වය, නායකත්වය, අධිෂ්ඨානය සහ සමගියෙන් එකතුවීම අවශ්‍ය වේවි. එමෙන්ම, ඒ සඳහා දේශපාලන ස්ථාවරත්වය සහ කඩිනම් ක්‍රියාමාර්ග අවශ්‍යයි. ශ්‍රී ලංකාව නැවතත් ආර්ථික ස්ථාවරත්වයේ මාවතට ගෙන ඒම සඳහා අපගේ ඒකාබද්ධ උත්සාහය දෙගුණ කිරීමට දැන් කාලයයි. වෙන කවරදාකටත් වඩා දැන්, පුද්ගලික අංශයට වඩාත් සර්වග්‍රාහී සහ තිරසාර ආර්ථිකයක් නිර්මාණය කිරීමේ වෙනසක් කළ හැකියි. අද දින මේ අදහස් දැක්වීම තුළ, ශ්‍රී ලංකාව සිය ආර්ථිකය පුනර්ජීවනය කිරීමට සහ සියලු ශ්‍රී ලාංකිකයින්ට ප්‍රතිලාභ සැලසෙන පරිදි දිගුකාලීන විසඳුම් ගොඩ නැගීමට ගත යුතු යැයි මා සිතන පියවර කිහිපයක්, හරියටම කියනවා නම්, පියවර පහක් ඔබ ඉදිරියේ තබන්නට මා කැමතියි.

මුලින්ම, ණය අර්බුදය විසඳාගත යුතු වනවා. ශ්‍රී ලංකාව IMF වෙත ගොස් ණය සහ නීති උපදේශකයින් බඳවා ගැනීමට සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා ආරම්භ කිරීමට ගෙන ඇති පියවර අපි සාදරයෙන් පිළිගන්නවා. ඒවා ධනාත්මක පියවරයන්. නමුත්, ශ්‍රී ලංකාව නැවත තිරසාර ආර්ථික වර්ධනයක් කරා ගෙන ඒම සඳහා කළ යුතු තවත් බොහෝ දේ තිබෙනවා. සාකච්ඡා සාර්ථක වුවහොත් මෙය ශ්‍රී ලංකාවේ 17 වැනි IMF පැකේජය වේවි. එය, අවසාන පැකේජය වන බව සහතික කර ගනිමු. ශ්‍ර්ර ලංකාව අනුගමනය කරන ප්‍රතිසංස්කරණ පියවර මගින් අවසානයේ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යහපත සඳහා යහපාලනය සහ විනිවිදභාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් ඇතුළත් කල්පවත්නා සහ තීරණාත්මක ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදුකිරීම සඳහා මේ අර්බුදයේ මූල හේතු ආමන්ත්‍රණය කළයුතු වනවා. ස්ථාවර විසඳුමක් එනතුරු අඩුපාඩු පියවාගැනීමේ පියවර සඳහා තවත් ඉඩ ඉතිරි වී නැහැ.

ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගතකරණයේ සහ මූල්‍ය ප්‍රතිසංස්කරණවල නිරත වනවිට, සියලුම ණය හිමියන්ට සාධාරණව හා සංසන්දනාත්මකව සැලකීම අතිශයින් වැදගත්. එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනකට භාජනය වන බොහෝ රටවල් ආමන්ත්‍රණය කළ යුතු ඉතා වැදගත් අංගයක් වනවා.

දෙවනුව, ශ්‍රී ලංකාව තම ජනතාව වෙනුවෙන් ආයෝජනය කළ යුතුයි. ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානාත්මතාවය සහිත ශ්‍රම බලකායක් තිබීම ඉතාමත් වැදගත්, කාන්තාවන් වචනාර්ථයෙන් ම තීරණ ගන්නා ස්ථානවල සිටීමත් නායකත්ව භූමිකා දැරීමත් අවශ්‍යයි. ව්‍යාපාරවල නිරතවන කාන්තාවන් වැඩියෙන් අපට වුවමනා බවත්, අපේ කාර්යය තවමත් සම්පූර්ණයෙන්ම නිමා වී නැති බවත් මේ කාමරය දෙස බැලුවාම අපට පෙනෙනවා. දිවයින පුරා බොහෝ ගම්මානවල සහ නගරවල ක්‍රියාත්මක වන ඔවුන්ගේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර සඳහා අරමුදල් ලබාගැනීමට සමාන ප්‍රවේශයක් කාන්තාවන් භුක්ති විඳිය යුතුයි. ඉහළ උගත්, නිර්මාණශීලී සහ නිපුණතා සහිත ශ්‍රම බලකායක් ඇති බවට ශ්‍රී ලංකාව නිවැරදිව උපයාගත් ඒ කීර්තිනාමය රඳවා තබා ගැනීමටත් තවදුරටත් එය ගොඩනැගීම සඳහාත් ගුණාත්මක ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව සඳහා සියලුම ශ්‍රී ලාංකිකයින්ට ප්‍රවේශය තිබීම අත්‍යවශ්‍ය වනවා. සාමය සහ ස්ථාවරත්වය ගොඩනැගීම සඳහා, ශ්‍රී ලංකාව නීතියේ ආධිපත්‍යය,

සියළුදෙනාගේ මානව හිමිකම්වලට ගරු කිරීම, සමාන නියෝජනය සහ විනිවිදභාවයෙන් යුත් පාලනය වැනි ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ආරක්ෂා කළ යුතුයි. මේ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් බිඳ වැටෙන විට, පෞද්ගලික අංශය, සිවිල් සමාජය සහ ස්වාධීන මාධ්‍ය විසින් මේ රටේ නායකත්වය සහ භාරකාරත්වය සම්බන්ධයෙන් රජය රජය වගවන බව සහතික කරගත යුතුයි. සියලුම ශ්‍රී ලාංකිකයන්ට සාමකාමී විරෝධතා දැක්වීමේ අයිතිය තහවුරු කළ යුතු අතර දණ්ඩමුක්තියේ සංස්කෘතිය අවසන් කළ යුතුයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගෙන ඒම සඳහා තවදුරටත් ප්‍රතිසංස්කරණ සිදුකිරීම ඇතුළුව සාධාරණ අධිකරණ පද්ධතියකට ප්‍රවේශය සියලුම ශ්‍රී ලාංකිකයන්ට සහතික කිරීම සඳහා, විනිවිදභාවයෙන් ක්‍රියාත්මක වන ස්වාධීන ආයතන පෝෂණය කරන මෙන් සහ සංහිඳියා ක්‍රියාවලිය සම්බන්ධයෙන් මහජන විශ්වාසය ගොඩනංවන මෙන් අපි රජයෙන් ඉල්ලා සිටිනවා. එමෙන්ම, සුළුතර පක්ෂ සමගින් සහ පුළුල් පරාසයක සිවිල් සමාජ සංවිධාන සමගින් සම්බන්ධවීම හරහා රටතුළ දේශපාලන ස්ථාවරත්වය ඇතිකරන මෙන් අප ඉල්ලා සිටිනවා. සිවිල් අවකාශය ආරක්ෂා කර සිවිල් සමාජ සංවිධානවලට නිදහසේ කටයුතු කිරීමට ඉඩ සලසන ලෙස අපි රජයෙන් ඉල්ලා සිටිනවා. ශ්‍රී ලංකාවේ සියලු ජනතාවට තිරසාර සහ සමෘද්ධිමත් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ දේශපාලන ප්‍රතිසංස්කරණ සමඟ බද්ධ කළ යුතුයි.

තුන්වැනිව, පුද්ගලික අංශයේ දියුණුව සඳහා ව්‍යාපාරික පරිසරය සහ ආයෝජන රාමු පරිසරය වැඩිදියුණු කළ යුතුයි. ආයෝජකයින් ශ්‍රී ලංකාවේ ඔවුන්ට ඇති අවස්ථා සොයන විට, නිලබලවාදී ප්‍රමාදයන් සිදුවීම අඩුකරගෙන ඔවුන්ට අසාධාරණ බාධාවක් ඇති නොවන බවට වගබලා ගැනීමෙන් රටට අත්‍යවශ්‍ය විදේශ ප්‍රාග්ධනය ගෙන්වා ගැනීම වැදගත් වනවා.

2020 දී, ශ්‍රී ලංකාව තුළ එක්සත් ජනපද සෘජු විදේශ ආයෝජන ඩොලර් මිලියන 13 ක් වූ අතර, ඒ වන විට රට තුළ මුළු සක්‍රීය එක්සත් ජනපද ආයෝජන ඩොලර් මිලියන 274 වී තිබුණා. වසර පහකට පෙර, 2015 දී ආයෝජනය කළ ඩොලර් මිලියන 17 සමඟ ඔබ මෙය සංසන්දනය කළහොත්, මෙහි වැඩිදියුණු කිරීමට ඉඩක් ඇති බවට මගේ අදහස සමගින් ඔබ එකඟ වනු ඇතැයි මට සිතෙනවා. රජයේ තීරණ ගැනීම්වල ඒකාකාර බව සහ විනිවිදභාවය පිළිබඳ කරුණු, සහ සියල්ලටත් වඩා, පුරෝකථනය කිරීමට නොහැකිවීම FDI වේගයෙන් වර්ධනය නොවීමට මූලික හේතු වනවා. අපගේ සමාගම්වලට අවශ්‍ය වන්නේ සම මට්ටමේ ක්‍රීඩා පිටියක්. හොඳ නියාමන රාමුවක්. ඒ වාගේම, ඔවුන්ගේ බේරුම්කරණය සහ ඔවුන්ගේ කොන්ත්‍රාත්තුවලට ගරු කරනු ඇතැයි විශ්වාසයක්. එවැනි ශක්තිමත් ආයෝජන වාතාවරණයක් ඇති විට, මෙරටට පැමිණීමට යොමු වනවා. කොහොම නමුත්, මෙය සැබෑවක් කරගැනීමට නම්, සෘජු විදේශ ආයෝජනවලට ඇතුල් වීමට බාධාවක් වන ලාභ නොලබන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ දුෂ්කර තීරණ ගැනීමට සිදු වේවි. පුද්ගලික අංශයේ සහභාගීත්වයට සහ බලශක්ති ප්‍රභවයන්ගේ විවිධත්වයට ඉඩ සැලසෙන පරිදි රටේ විදුලිබල ක්ෂේත්‍රය නවීකරණය කිරීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මෑතකාලීන උත්සාහයන් අපි සාදරයෙන් ගන්නවා.

සිවුවැනිව, ශ්‍රී ලංකාව හරිත තාක්ෂණයට සහ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රවලට මාරුවීම සඳහා මෙය අවස්ථාව කරගත යුතුයි. දේශගුණ ක්‍රියාමාර්ග සඳහා වන පුළුල් ප්‍රතිපත්තියේ කොටසක් වශයෙන් 2030 වනවිට විදුලි උත්පාදනයෙන් සියයට 70ක් පුනර්ජනනීය

මූලාශ්‍රවලින් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවට ඇති ඉලක්කයෙන් අප දිරිගැන්වෙනවා. මේ ඉන්ධන අර්බුදයෙන් අප යමක් ඉගෙනගත්තා නම්, ඒ, පුනර්ජනනීය අංශයට මාරුවීමට කාලය එළඹී ඇති බවයි! මේ සම්බන්ධයෙන් ඇමරිකානු සමාගම්වලට ලබාදිය හැකි නවතම තාක්ෂණයෙන් ඵල නෙලා ගැනීමට මෙන්ම, එක්සත් ජනපදය පාදක ව්‍යාපෘති මූල්‍යකරණයට ප්‍රවේශය ලබාගැනීමටත් ශ්‍රී ලංකාවට හැකියි. ගිය වසරේ G7 හවුල්කරුවන් සමගින් එක්වී බයිඩන් ජනාධිපතිතුමා නිවේදනය කළ Build Back Better World හවුල්කාරිත්වයේ ප්‍රමුඛ අවධානයක් මෙම පවිත්‍ර බලශක්තිය වෙත යොමුවී තිබෙනවා.

ශ්‍රී ලංකාව සුළඟ සහ සූර්යාලෝකය වැනි තිරසාර බලශක්ති ප්‍රභවයන්ගෙන් බහුල වන නමුත් මේ සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා බලශක්ති අංශය සංවර්ධනය වී නැහැ. ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තිරසාර සහ විශ්වාසදායක වෙළඳපල-ධාවන පද්ධතියක් බවට පරිවර්තනය කරන්නට උපකාර කිරීම සඳහා අපි ඩොලර් මිලියන 19 ක USAID ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන දියත් කළේ එනිසායි. මේ ව්‍යාපෘතිය මගින් ප්‍රාග්ධනයට ප්‍රවේශ වීමට පහසුකම් සලසා දෙන අතර රජයේ පුනර්ජනනීය බලශක්ති ඉලක්කවලට සහය දක්වන්නට ආයෝජන ආකර්ෂණය කරනවා. පාවෙන සූර්ය ස්ථාපන තරඟකාරී ලෙස සංවර්ධනයට සහාය වීම සඳහා USAID හි Transaction Advisory Fund නම් අරමුදල ඩොලර් 850,000ක් ලබාදෙන්නට පොරොන්දු වී තිබෙනවා. මේ ව්‍යාපෘතිය මඟින් රට තුළ බලශක්ති කාර්යක්ෂමතාව සහ ඉල්ලුම පැත්තේ කළමනාකරණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා සහ උසස් තාක්ෂණයන් ප්‍රවර්ධනය සඳහා  ක්‍රියා කරනු ඇති.

ශ්‍රී ලංකාවේ විදුලි වාහන අංශය තවදුරටත් දියුණු කිරීමට උපකාර කිරීම සඳහා VEGA Innovations වෙත ලබාදෙන තාක්ෂණික සහාය පිළිබඳව ද අපි මෑතකදී නිවේදනය කළා. මෙය VEGA Innovations හි විදුලි “tuk tuks” ඇතුළු විදුලි වාහන ප්‍රවර්ධනය කිරීමට දරන උත්සාහයටත් ජාතික වාහන ආරෝපණ ජාලයක් අත්හදා බැලීමට සහ දේශීයව නිර්මාණය කර ඇති බැටරි සහ ඉන්වර්ටර් නිෂ්පාදනයටත් සහය වේවි. මමත් ඉන් එක්  රථයක් පදවා බැලුවා, එහි කාර්යක්ෂමතාවයෙන් මා පුදුමයට පත් වුවා.  මේ වර්ගයේ ත්‍රිරෝද රථවලින් කොළඹ වීථි පිරී යන දවසක් ගැන මට සිතාගන්නට පුළුවන්. ශ්‍රී ලාංකීය බලශක්ති ක්ෂේත්‍රය අවසානයේ වෙළෙඳපොළ මත පදනම් වූ ක්‍රමයකට සංක්‍රමණය වීම ශ්‍රී ලාංකීය පෞද්ගලික ව්‍යාපාරවලට මෙන්ම ජාත්‍යන්තර ආයෝජකයින්ට වැඩි අවස්ථාවක් ලබාදෙන අතරම මෙම අර්බුදයෙන් ගොඩ ඒමට සහ එහි ආර්ථිකය යළි ගොඩනැගීමට ප්‍රයෝජනවත් වේවි. ඉහළ ප්‍රසිද්ධියක් සහිත, එනමුත් ආර්ථිකමය වශයෙන් සැකසහිත යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට වඩා බොහෝ විට, මෙවැනි මූල්‍ය ආධාර දිගුකාලීන, තිරසාර ධාරිතා සංවර්ධනයට බොහෝ සෙයින් දායක වනවා.

අවසාන වශයෙන් පස්වැන්න - මෙය මගේ කණ්ඩායම සහ මම සැබවින්ම උද්යෝගිමත් වන ක්ෂේත්‍රයක් - ශ්‍රී ලංකාවට එක්සත් ජනපදය වෙත සිය අපනයන සහ ආයෝජන වර්ධනය කළ හැකියි. තනි රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වෙළඳපොළ වන්නේ එක්සත් ජනපදයයි. එනිසා ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සඳහා අපගේ දායකත්වය මේ සම්බන්ධයෙන් අසමසම යි. අපගේ ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට තුනක් පමණ වනවා. අපගේ ඇස්තමේන්තු අනුව, එක්සත් ජනපදයට අපනයන සිදුකරන ශ්‍රී ලාංකික අපනයනකරුවන් මෙරට180,000 දෙනෙකුට සෘජු රැකියා සපයනවා. අප

සියලු දෙනාම පුළුල් කිරීමට අපේක්ෂා කළ යුතු ආර්ථික හවුල්කාරිත්වය මෙයයි. එක්සත් ජනපදයේ ආයෝජන සිදු කිරීම ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයට ඇති තවත් අවස්ථාවක්. කුමන කර්මාන්තයක වුවද එක්සත් ජනපදයේ ආයෝජනය කරන ව්‍යාපාර, ලෝකයේ වඩාත්ම විවෘත වෙළඳපොලකින් තරඟකාරී වාසි ලබාගන්නවා. ඩොලර් ට්‍රිලියන 20 ක දළ දේශීය නිෂ්පාදිතයක් සහ මිලියන 325 ක ජනතාවක් සහිත එක්සත් ජනපදය පෘථිවියේ විශාලතම පාරිභෝගික වෙළඳපොළ ඔබට ලබාදෙනවා. ලොකු කුඩා සියලු ප්‍රමාණයේ සමාගම් එක්සත් ජනපදයේ නවෝත්පාදනය ගෝලීය ව්‍යවසායයක් බවට පත් කිරීමට උදවු කරනවා, එමගින්, නවෝත්පාදනයෙන් සහ පෙළඹවීමෙන් සුපෝෂිත පරිසර පද්ධතියක් නිර්මාණයවීමට සහ එම ව්‍යාපාරවලට ඉන් ඵල නෙලාගැනීමට මග පෑදෙනවා.

මෙය ශ්‍රී ලාංකීය ඉතිහාසයේ තීරණාත්මක මොහොතක් වන අතර, අන් කවරදාටත් වඩා සමගිය වැදගත් වන කාලයක් වනවා. එකමුතුකම කියන්නේ අප හැමදෙනාම සැමවිටකම එකඟ වෙනවා කියන එක නොවේ. එයින් අදහස් කරන්නේ අද දින අප මුහුණදෙන ප්‍රශ්න විසඳීමට එකතු වී අප සැම කෙනෙකුටම හැකි සැම දෙයක්ම නිර්මාණාත්මකව කිරීමයි. වසර හැත්තෑවක් තිස්සේ එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කිරීමට, දේශීය ධාරිතාව ඉහළ නැංවීමට සහ ශ්‍රී ලාංකික ජනතාවගේ සමෘද්ධිය සහ යහපැවැත්මට සහාය වීම සඳහා විදේශ ආධාර, ණය, වෙළඳ අවස්ථා සහ ද්වි-මාර්ග අධ්‍යාපනික හුවමාරු වැඩසටහන් ලබා දී තිබෙනවා. මෙවැනි අභියෝගාත්මක කාලවලදී එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සමඟ දිගටම සිටිනවා. පසුගිය සති කිහිපය තුළ, අපි ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර සඳහා ඩොලර් මිලියන 120 ක්, ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය සඳහා ඩොලර් මිලියන 27 ක් සහ ශ්‍රී ලංකාවේ වඩාත්ම අවදානමට පත්වී සිටින ජනතාවට උපකාර කිරීම සඳහා ඩොලර් මිලියන 30 කට අධික නව මානුෂීය, තාක්ෂණික සහ ආහාර සුරක්ෂිතතා ආධාර ප්‍රකාශයට පත් කරනු ලැබුවා. ඉදිරි මාසවලදී එම ආධාර තවදුරටත් වැඩිකිරීමට අප බලාපොරොත්තුවෙන් සිටිනවා. එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සඳහා මිතුරෙකු සහ හවුල්කරුවෙකු වනවා. අපගේ පොදු අනාගතය කෙරෙහි සහ වර්තමාන අභියෝග සාර්ථකව ජය ගැනීමේ බලාපොරොත්තු ඇතිව මා සිටිනවා. මේ අභියෝගාත්මක කාලවලදී අපේ පැවැත්ම ආරක්ෂා කරගැනීම ගැන සභාපතිතුමා කථා කළා මම එය තවත් පියවරක් ඉදිරියට ගෙන ගොස් මෙසේ කියන්නට කැමතියි. අපට අවශ්‍ය වන්නේ ශ්‍රී ලංකාව තම පැවැත්ම තහවුරු කරගැනීම පමණක් නොව දියුණු වීමටත්, මෙම අර්බුදය හරහා ශක්තිමත් වීමටත් වඩා හොඳ වීමටත්ය. එය කිරීම දුෂ්කර බවක් පෙනෙන්නට ඇතත් එය කළ හැකි දෙයක් කියා මා විශ්වාස කරනවා. අප එක්ව ශ්‍රී ලංකාව දියුණු වන බවට සහතික කරගනිමු. ඔබට ස්තුතියි.